**ජාතික අධ්‍යාපන ආයතනය - 2016**

**-------------------------------------**

ජාතික අධ්‍යාපන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තුමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06**

දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා ගෙවිය යුතු අවසන් බිල්පත, වෙනුවෙන් රු.8,908,928 ක් 2015 වර්ෂයේදී ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණද 2017 ජනවාරි මාසයේදී සත්‍ය වශයෙන් රු.5,142,899 ක් පමණක් ගෙවීම නිසා 2015 සහ 2016 වර්ෂවලදී ගොඩනැගිලි වටිනාකම රු.3,766,029 කින් හා ක්ෂය රු.376,603 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 47 වගන්තිය පරිදි වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකළ යුතු වුවද ආයතනයේ වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09**

ආයතනයේ ගිණුම් ප්‍රතිපත්ති වලට අනුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විකිණීම සඳහා වූ පොත් තොගය රු.22,843,838 ක් ලෙස විකුණුම් මිලට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභ අලාභ අපහරණ ලාභ අරමුදල නම් අරමුදලක් මඟින් ගැලපීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත සඳහන් අඩුපාඩු පැවතීම හේතුවෙන් එහි තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගෙවිය යුතු වියදම් රු.7,151,969 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ජංගම නොවන වත්කම් මිලදීගැනීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.7,786,795 ක් මුදලින් ගෙවීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(iii) මාර්ගස්ථ තොගවල සටහන් කර තිබූ රු.46,991,171 ක ජංගම නොවන වත්කම් කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වල දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයට අදාල මුදලින් ගෙවූ පාරිතෝෂික ප්‍රමාණය රු.5,353,157ක් පමණක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි එය රු.5,697,314 ක් ලෙස දැක්වීම නිසා රු.344,157 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු දේපල පිරියත උපකරණ යටතේ සමාලෝචිත වර්ෂයේ කාර්යාල ලී බඩු උපකරණ එකතු කිරීම් ලෙස සටහන් කර ක්ෂය කිරීම්ද සිදුකරන ලද රු.1,614,600 ක් නැවතත් ජංගම වත්කම් යටතේ මාර්ගස්ථ තොග හා ගෙවිය යුතු වියදම් යටතේ ඇතුලත්කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයට පෙර මුද්‍රණය කර තිබූ භාවිතයෙන් ඉවත් කරන ලද පැරණි විෂය නිර්දේශ ඇතුළත් රු.10,369,094 ක් වටිනා ගුරු මාර්ගෝපදේශ අවසන් තොගයට ඇතුලත් කර තිබීම නිසා අවසන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මීපේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත් හා උපදේශක ගාස්තු ගෙවිය යුතු ලෙස දෙවරක් බිල් කිරීම හේතුවෙන් රු.6,172,195 ක් ගොඩනැගිලි ගිණුමේ හා උපචිත වියදම් ගිණුමේ වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.240,605 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුම් දෙකක් අතර මුදල් හුවමාරු කිරීමේදී ඇති වූ දෝෂයක් හේතුවෙන් රු.8,843,090 කින් ගෙවිය යුතු වියදම් ගිණුම හා ලැබිය යුතු ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ආයතනයෙන් ඉවත් වූ නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් පාරිතෝෂික රු.164,140 ක් වැඩිපුර වෙන්කිරීම් සිදුකර තිබුණි.

(උ) වර්ෂය තුල ආපදා ණය පොලී වශයෙන් ලැබී තිබුණු රු.2,386,738 ක්, ආදායමට නොගෙන ණය අරමුදල නමින් අරමුදලකට බැර කර තිබුණි.

### 2.2.4. පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් විගණනය වෙත ලබාදුන් වැඩමුළු අත්තිකාරම් උපලේඛනය හා වැඩමුළු අත්තිකාරම් ගිණුමෙහි ශේෂය අතර රු.423,706 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගුරු විද්‍යාල අංශයේ තොරතුරු අනුව ඉදිරියට ගෙවූ පාඨමාලා ගාස්තු රු.22,692,418 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.34,577,626 ක් වීමෙන් රු.11,885,208 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසැල් පදනම් කරගත් ඇගයීම් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය වෙනුවෙන් 2008 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 3,237,800 ක මුදලක් හා රු.595,122 ක වර්ෂ 05 ක් ඉක්මවූ ලැබිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) එකතුව රු.5,260,853 ක් වූ ගෙවිය යුතු වියදම් තුල වර්ෂ පහක කාලයක් ඉක්මවූ රු.372,295 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.1.2 වගන්තිය | වැඩබැලීමේ පත්වීම සඳහා නිර්දේශ කරනු ලබන නිලධාරියා සෑම අතින්ම සුදුසුකම් තිබෙන පුද්ගලයෙකු විය යුතු වුවත්, විවිධ අවස්ථාවලදී අවවාද කිරීම්වලට ලක්ව තිබියදී හා 2007 සැප්තැම්බර් 15 දිනට පසුව වැටුප් වර්ධක කිසිවක් උපයාගෙන නොතිබුණු නිලධාරියෙකු 2016 ජනවාරි 05 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන වැඩබලන තනතුරට පත්කර තිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය | භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුවක් පිරිනැමීමේදී රු. 500,000 ක් ඉක්මවන විට විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කළයුතු වුවද ආයතනයේ මුද්‍රණාලය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.19,813,500 ක් පිරිවැය වූ යන්ත්‍ර 02 ක් මිලදීගැනීමේදී සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.37,792,759 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.157,631,149 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.119,838,390 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ හා විදේශ ප්‍රදාන රු.28,497,342 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.105,003,558 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු ආයතනයේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළිවෙලින් රු.256,417,465 ක්, රු.297,593,788 ක් හා රු.453,446,003 ක් වී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ දායකත්වය සියයට 21 කින් අඩුවී තිබුණි.

## 3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ආයතනයේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සැලකීමේදී ඉකුත් වර්ෂයේ 5.4:1 ට පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 4.7:1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයේ 5.2:1 ක් හා සමාලෝචිත වර්ෂයේ 4.3:1 ක් ව පැවතුණි. ජංගම වත්කම් තුල සියයට 82 ක් නියෝජනය කරනුයේ භාණ්ඩාගාර බැඳුම්කර හා බැංකු ජංගම ගිණුම් ශේෂ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි. ආයතනය සතුව ඇති බැංකු ගිණුම් 05 න් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 97 ක් හා රු.මිලියන 92 ක ශේෂයක් පැවති අතර, අවශ්‍යතා ඉක්මවා මුදල් ශේෂ පවත්වා ගැනීමත්, කෙටිකාලීන ආයෝජන සිදුකිරීමත්, තොග ශේෂය තුල රු. මිලියන 10 ක යල් පැනගිය තොග හා රු. මිලියන 46 ක ජංගම නොවන වත්කම් පැවතීම හේතුවෙන් ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත වැඩිවී තිබුණි.

## 3.3 ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වී ඇති ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 04 දෙනෙකුට එරෙහිව ආයතනය විසින් එකතුව රු.8,538,064 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය සඳහා සැලසුම්ගත වැඩසටහන් සකස් කිරීම, අධ්‍යාපන ක්‍රමයෙහි කාර්යසාධනය, අරමුණු ව්‍යුහ හා විෂය ප්‍රමාණය ඇතුළු අධ්‍යාපන ක්‍රමය පිළිබඳව හා අධ්‍යාපන සමාජීය, ආර්ථික හා වෙනත් අංශ පිළිබඳව අධ්‍යයන පවත්වා ගෙන යාම, අධ්‍යාපන ක්‍රමයෙහි නියැලී සිටින කාර්ය මණ්ඩලයේ වෘත්තීය හා කළමනාකරණ නිපුණත්වය වැඩිදියුණු කිරීම, පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම ආදිය ආයතනයේ ප්‍රධාන අරමුණු වේ.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක නොවීම සමස්ථ ශ්‍රී ලාංකික සිසු දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි සෘජුවම බලපාන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) සිංහල, ආගම හා සාරධර්ම විද්‍යා හා ගණිත යන දෙපාර්තමේන්තු හරහා වැඩසටහන් 04 ක් මඟින් ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 1200 ක් පුහුණු කිරීමට 2016 වර්ෂය තුල සැලසුම් කර තිබූ නමුත් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තු 06 ක් මඟින් ක්‍රියාත්මක කළ වැඩසටහන් 17 කින් ගුරුවරුන් 9,000 ක් පුහුණු කිරීමට සැලසුම් කර තිබූ නමුත් පුහුණු කර තිබුණේ 5,390 දෙනෙක්ද වූ අතර සැලසුම් කළ සංඛ්‍යාවෙන් සියයට 40 ක් පුහුණු කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟා වී නොතිබුණි.

(iii) දෙමළ, සමාජ විද්‍යාව, ගණිතය, වාණිජ්‍ය, ශාස්ත්‍රීය හා විදේශ භාෂා හා ද්වී භාෂා දෙපාර්තමේන්තු 05 ක් මඟින් විෂයයන් 18 කට අදාලව ගුරු අත්පොත් වල පළමු කෙටුම්පත පමණක් නිමකර තිබූ අතර සෞන්දර්ය, ආගම හා සාරධර්ම, සමාජ විද්‍යා, ශාස්ත්‍රීය හා විදේශ භාෂා දෙපාර්තමේන්තු 04 ක් මඟින් විෂයයන් 12 කට අදාලව ගුරු අත්පොත් අවසන් කෙටුම්පත් පමණක් සකස් කර තිබුණි. කෙසේ වුවද මෙම අත්පොත් අනුමත කර මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(iv) සිංහල දෙපාර්තමේන්තුව මඟින් 12-13 ශ්‍රේණි සඳහා මාධ්‍ය අධ්‍යයනය ගුරු අත්පොත් සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 6-8 ශ්‍රේණි සඳහා තොරතුරු තාක්ෂණය ගුරු අත්පොත් සකස් කිරීම සමාලෝචිත වර්ෂය තුල සැලසුම් කර තිබුණද ඒ සඳහා ප්‍රවේශ වී හෝ නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සිංහල දෙපාර්තමේන්තුව විසින් රු.12,738,410 ක් වැයකර වැඩමුළු 60 ක් හා තාක්ෂණික දෙපාර්තමේන්තුව විසින් රු.18,453,549 ක් වැයකර වැඩමුළු 183 ක් පවත්වා තිබුණි. එම වැඩමුළුවලින් විගණන පරීක්ෂණය සඳහා නියැදියක් වශයෙන් තෝරාගත් මාධ්‍ය සමාජ පිහිටුවීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණින් ගුරුවරුන් 100 දෙනෙකු පුහුණු කිරීමේ වැඩමුළුව තුන්වන හා හතරවන කාර්තු මුල පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර මෙම වැඩමුළු 2016 දෙසැම්බර් 06 හා 07 යන දෙදින තුල පවත්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වැඩමුළු සඳහා ගුරුවරුන් 100 දෙනෙකු සහභාගී කර ගැනීමට අපේක්ෂා කළ ද ගුරුවරුන් 19 දෙනෙකු පමණක් සහභාගී වී තිබුණි.

(ii) ගුරු පුහුණු වැඩසටහන් සඳහා ගුරුවරුන් සහභාගී කරගැනීම පළාත් අධ්‍යාපන කාර්යාල හරහා විධිමත් ක්‍රමවේදයකට සිදුකළ යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජීවන කුසලතාවයක් වශයෙන් ඉංග්‍රීසි දැනුම දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (English as a Life Skill)

8 හා 9 ශ්‍රේණිවල ජීවන කුසලතාවයක් වශයෙන් ඉංග්‍රීසි දැනුම දියුණු කිරීම සඳහා 2014 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතිය යටතේ ඩීවීඩී වැඩසටහන් 50 ක් නිෂ්පාදනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.4,500,000 ක මුදලක් ආයතනය වෙත ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතනය විසින් රු.1,333,441 ක් වැයකර 8 හා 9 ශ්‍රේණි සඳහා පිළිවෙලින් වැඩසටහන් 15 ක් හා 9 ක් නිෂ්පාදනය කර තිබූ අතර එයින් 8 ශ්‍රේණියේ වැඩසටහන් 6 ක පමණක් අවසන් සංස්කරණ කටයුතු සිදුකර තිබුණි. 9 ශ්‍රේණියේ කිසිදු වැඩසටහනක අවසන් සංස්කරණ කටයුතු සිදුකර නොමැති බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

(ii) 2016 වර්ෂය අවසන් වන විටත් ඉහත සඳහන් ප්‍රගතිය හැරුණු විට ව්‍යාපෘතියෙන් ආයතනය හෝ අමාත්‍යාංශය බලාපොරොත්තු වූ අරමුණු කරා ළඟාවීමට නොහැකි වී තිබූ අතර රු.3,166,559 ක් වූ ඉතිරි මුදල නැවත අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2014 දෙසැම්බර් 31 දින යවා තිබුණි.

(ආ) නැණස අධ්‍යාපනික වැඩසටහන

2008 ජනවාරි 17 දිනැති අංක අමප/08/0002/316/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව චන්ද්‍රිකා තාක්ෂණය හරහා අධ්‍යාපන නාලිකාවක් ආරම්භ කිරීමට අනුමැතිය ලබා දී තිබුණු අතර 2008 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් යුතුව මෙම වැඩසටහන සඳහා පාඩම් නිර්මාණය කිරීම ආයතනය වෙත පවරා තිබුණි. 2008 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයකට සහ 2011 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයකට ඉහත කී ආයතන ත්‍රිත්වය අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පාඩම් නිර්මාණය කිරීම ආයතනය විසින් සිදුකරන ලද අතර 2013 වර්ෂයේදී විෂය නිර්දේශ පදනම් කරගනිමින් විෂයයන්ට අදාල වැඩසටහන් 990 ක් ද සිංහල මාධ්‍ය පොදු හා කෙටි වැඩසටහන් ඇතුළුව සම්පූර්ණ වැඩසටහන් 2,115 ක් ද නිෂ්පාදනයට සැලසුම් කර තිබුණි. සමාගම විසින් රු.6,318,782 ක මුදලක් ලබා දී තිබුණ ද ආයතනය විසින් වැඩසටහන් 104 ක් පමණක් නිෂ්පාදනය කර තිබීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම කටයුත්ත ධර්මවාහිනී පදනම වෙත භාරදී තිබුණි.

(ii) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් රු.1,489,338 ක් වටිනා සංස්කරණ යන්ත්‍රයක් 2013 ජනවාරි 17 දින ආයතනයට ලබාදී තිබුණු අතර මෙම වැඩසටහන අතරමඟ නවතා දමා තිබීම හේතුවෙන් මෙම යන්ත්‍රය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2015 වර්ෂයේ විකාශනය ආරම්භ කිරීමට නියමිතව තිබූ අ.පො.ස. (උසස් පෙළ) ඉංජිනේරු හා ජෛව තාක්ෂණවේදය විෂයට අදාල වැඩසටහන් නිෂ්පාදනය කිරීමටත් තාක්ෂණවේදය පාඩම් තිර පිටපත් ලියා 2015 ජූනි මාසයේදී අවසන් කිරීමටත් ආයතනය සැලසුම් කර තිබුණි. මේ සඳහා සමාගම ලබාදුන් තොරතුරුවලට අනුව සමාගම විසින් රු.1,058,800 ක මුදලක් ආයතනය වෙත ලබාදී තිබුණද තාක්ෂණවේදය විෂය ධාරාව විකාශනය කිරීමට අදාල පාඩම් සකස් කර ලබාදී විකාශනය ආරම්භ කිරීමට ආයතනය අසමත් වී තිබුණි.

(ඇ) 2012 ජූනි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රු.85,794,089 ක් වැයකර ආයතනය විසින් දකුණු ආසියාවේ ගුරුවරුන් පුහුණු කිරීමේ අරමුණින් මීපේ ප්‍රදේශයේ දකුණු ආසියානු ගුරුපුහුණු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය 2012 සැප්තැම්බර් මාසයේ එළඹ තිබුණු ගිවිසුමට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය ක්‍රියා කළයුතු ආයතන වූ අතර ගිවිසුමේ 8 වන වගන්තිය අනුව යුනෙස්කෝ ආයතනය තාක්ෂණ සහාය ලබාදීමට එකඟ වී තිබුණි. 15 වන වගන්තිය අනුව ගිවිසුමේ කාලය වර්ෂ 06 ක් වන අතර මේ වනවිට වර්ෂ 04 කට අධික කාලයක් ඉක්ම ගොස් තිබුණ ද යුනෙස්කෝ තාක්ෂණ ආධාර ලබාගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනය අපොහොසත්ව තිබුණි. මේ හේතුවෙන් මධ්‍යස්ථානය ඉදිකිරීමේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඈ) වටිනාකම රු.78,600,000 ක්වූ හෙක්ටයාර් 7.0958 ක තැන්නකැලේවත්ත ඉඩම හා රු.65,000,000 ක් වටිනා බඳුවත්ත (කහටහේන) ඉඩම ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 ජනවාරි 13 සිට 2016 සැප්තැම්බර් 21 දින දක්වා කාලය තුල ජාතික අධ්‍යාපන ආයතනයේ අලෙවි සැල තුල අලෙවිය සඳහා තිබුණු අලෙවි වටිනාකම රු.2,511,000 ක් වූ ප්‍රකාශන පිටපත් 10,872 ක විකුණුම් මිල ගණන් වල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ඊ) මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව දිවයිනේ පාසල් 4,722 ක සිසුන් අතර බෙදාහැරීම සඳහා ජාතික සිතියම් සංග්‍රහය පිටපත් 10,000 ක මුද්‍රණ ඇණවුමක් රජයේ මුද්‍රණාලය වෙත 2015 සැප්තැම්බර් 29 දින භාරදී රු.2,442,000 ක මුදලක් 2015 නොවැම්බර් 09 දින ඒ වෙනුවෙන් ගෙවා තිබුණද පිටපත් 170 ක් 2016 දෙසැම්බර් 31 දින දක්වාම ලැබී නොතිබුණි. කෙසේ වුවද පිටපත් 4,775 ක් ලැබී මාස 09 ක් ඉක්ම ගොස් තිබුණද ඒවා පාසල් අතර බෙදා හැරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ පැවතුණි.

(උ) ද්විතීය පදනම මත වසරක කාලයකට ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) තනතුරට පත්කර තිබුණු නිලධාරියාට 2016 පෙබරවාරි 16 දින සිට 2017 අගෝස්තු 15 දින දක්වා සහකාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත ආයතනයේ විදේශීය නේවාසිකාගාරයේ නේවාසික පහසුකම් සලසා දී තිබුණි. අංක 429 හා 2015 අප්‍රේල් 15 දිනැති අභ්‍යන්තර පාලන චක්‍රලේඛයට අනුව විදේශීය නේවාසිකාගාරයේ කාමරයක දිනක නේවාසික ගාස්තුව ලෙස රු.1,500 ක් අයකළ යුතු වුවද මාසයකට රු.1,500 ක් බැගින් රු.26,922 ක නේවාසිකාගාර ගාස්තුවක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකරගෙන තිබුණි. තවද ජල හා විදුලිය ගාස්තු වෙනුවෙන්ද කිසිදු මුදලක් ඔහුගෙන් අයකර නොතිබුණි.

(ඌ) ආයතන පරිශ්‍රයේ හා මීපේ ගුරු මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටි නිල නිවාස 12 සඳහා වෙන්වෙන් වශයෙන් ජල මීටර සවිකර නොතිබීම නිසා එහි පදිංචි කිසිදු නිලධාරියෙකුගෙන් ජලය සඳහා ගාස්තු අයකර නොතිබුණි. එම නිල නිවාස ඇතුළුව සමස්ථ ආයතනය වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රු.2,210,384 ක් හා 2016 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා රු.3,036,711 ක් වශයෙන් එකතුව රු.5,247,095 ක ජල බිල්පත් ආයතනය විසින් ගෙවා තිබුණි.

(එ) අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ දී වටිනාකම රු.2,430,180 ක් වූ දේශන ශාලා පුටු 90 ක් හා මේස 90 ක් මිලදීගෙන එම මේස හා පුටු ස්ථානගත කිරීම සඳහා හොඳ තත්ත්වයේ පැවති දේශන ශාලා පුටු 213 ක් හා මේස 228 ක් එක් එක් අංශ වෙතින් විමසීම් සිදුකර අංශ 12 ක් වෙත බෙදාහැර තිබුණි.

(ඒ) ආයතනයේ පවතින ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් ඇති විට ණයගැති කාලවිශ්ලේෂණය හා ණය අයවීම් සමාලෝචනය කර බොල් ණය සඳහා ප්‍රතිපාදන ප්‍රමාණය තීරණය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාම රු.22,169 ක් ලෙස එකම වටිනාකමක් බොල්ණය ලෙස ප්‍රතිපාදනය කර තිබුණි.

## 4.3. අරමුදල් උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අ.පො.ස. (උසස් පෙළ) තෝරාගත් විෂය සඳහා සම්පත් මූලාශ්‍ර ග්‍රන්ථ 06 ක් සකස් කිරීමට හා මුද්‍රණය කිරීමට 2014 වර්ෂයේදී ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ කටයුතු දෙපාර්තමේන්තු ආධාර (DFAT / (AUSAID) මඟින් රු.15,400,000 ක අරමුදලක්, ප්‍රතිපාදනය කර තිබුණි. එසේ ප්‍රතිපාදනය කර වර්ෂ 03 ක කාලයක් අවසන් වී තිබුණද, එම ග්‍රන්ථ මුද්‍රණ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.67,734,282 ක් වූ ණය අරමුදල නමින් අරමුදලක් පවත්වාගෙන යන අතර එහි අරමුණ විගණනයට පැහැදිලි නොවීය. කෙසේ වුවද එම අරමුදල ණය ලබාදීමට හෝ වෙනත් කාර්යයකට නොයොදවා ආපදා ණය පොලී බැර කරමින් දිගින් දිගටම පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.8,750,000 ක් වෙන්කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන තෙක්ම මෙම අරමුදල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) අරමුණුගත කාර්යයන්හි යොදවා ගැනීමකින් තොරව ආයතනයේ ජංගම ගිණුම් 03 ක රු.41,086,056 සිට රු.90,418,980 දක්වා වූ පරාසයන්හි අවශ්‍යතාවය ඉක්මවා මුදල් ශේෂ සමාලෝචිත වර්ෂයේදී පැවති බව නිරීක්ෂණය විය.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යුත් ප්‍රචාරණ අංශය විසින් විවිධ මාතෘකා යටතේ 2013, 2014 හා 2015 වර්ෂයන්හිදී වීඩියෝ වැඩසටහන් නිෂ්පාදන 90 ක් ද 2016 වර්ෂයේදී වීඩියෝ වැඩසටහන් 31 ක්ද නිෂ්පාදනය කර තිබුණද එම නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කර එම නිෂ්පාදනවලින් අධ්‍යාපන ක්ෂේත්‍රයට ඵලදායී ප්‍රයෝජනයක් ලබාගැනීමට කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) 2011 සහ 2012 වර්ෂවල නිෂ්පාදනය කරන ලද රු.775,375 ක් වටිනා කැසට් පටි 6,203 ක් ද සෞන්දර්ය හා අනෙකුත් දෙපාර්තමේන්තු විසින් විවිධ මාතෘකා යටතේ නිෂ්පාදනය කරන ලද රු.786,000 ක් වටිනා සංයුක්ත තැටි 4,798 ක් ද 2016 දෙසැම්බර් 31 දිනට අලෙවි නොවී ඉතිරිවී තිබුණු අතර වර්ෂ 05 ක පමණ කාලයක් තිස්සේ ඒවා අලෙවි සැලේ ගබඩා කර තිබුණි.

**4.5** **ප්‍රමාද වූ ව්‍යාපෘති**

2008 වර්ෂයේදී ආයතනයේ තෙමහල් නේවාසිකාගාරයේ ඇස්තමේන්තු පිරිවැය රු.27,848,100 ක් වූ වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම වෙනුවෙන් සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා උපදේශක ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 05 ක් එනම් රු.1,200,949 ක් ගෙවා වසර 09 ක් ගතවී තිබුණු නමුත්, එහි ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

**4.6** **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 22 දිනැති අංක DMS/B1/37/3/Vol III දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 652 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 439 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට තනතුරු 213 ක් පුරප්පාඩු වී පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. ආයතනයේ පුරප්පාඩු වී තිබුණු තනතුරු වලින් 124 ක් ඉහළ කළමනාකරණයට අයත් තනතුරු වූ නිසාත් එම තනතුරු වලින් 104 ක ප්‍රමාණයක් කථිකාචාර්යවරුන් වීම හේතුවෙන් දැයේ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා වන කාර්යභාරයේදී විෂයමාලා සංවර්ධනය, ගුරු අත්පොත් සකස්කිරීම ආදී කටයුතු සඳහා ජාතික අධ්‍යාපන ආයතනය වෙත පැවරී ඇති වගකීම් නිසිලෙස ඉටුකිරීමට ඇති හැකියාව නිසි අයුරු ඉටුවන්නේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

(ආ) කළමනාකරණ සහකාරවරුන් 18 දෙනෙකුගේ තනතුරුවල පුරප්පාඩු පිරවීමටත් 2016 මාර්තු හා සැප්තැම්බර් මාසවල අතිරේක අධ්‍යක්ෂක ජනරාල් තනතුරක පුරප්පාඩුව හා අතිරේක නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ හා සහකාර කථිකාචාර්ය තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහාත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2015 මාර්තු මාසයේදී අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා රු.399,599 ක් වැයකර ආයතනය විසින් 2015, 2016 වර්ෂවල පුවත්පත් දැන්වීම් පලකර තිබුණද එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයතනයට නොහැකිව තිබුණි.

(ඇ) ආයතනයේ පුරප්පාඩුව පැවතුන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 04 ක් හා අධ්‍යක්ෂ තනතුරු 14 ක් සඳහා ද්විතීයන පදනම සහ අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කර තිබුණු අතර ද්විතීයන පදනම මත පත්කර තිබූ නිලධාරීන් සඳහා රු.1,061,558 ක දීමනා ගෙවා තිබුණි.

(ඈ) ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ තනතුරු 09 ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවාගැනීම වෙනුවට 2015 හා 2016 වර්ෂවලදී වැඩබැලීමේ පත්වීම් ලබාදී වැඩබැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,181,972 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් සහකාර කථිකාචාර්ය තනතුරු 41 ක පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සහකාර කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.4,048,175 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ඊ) 1993 මාර්තු 01 දින ව්‍යාපෘති නිලධාරියෙකු වශයෙන් සේවයට බැඳී ඇති වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විකල්ප අධ්‍යාපන) අවස්ථා ගණනකදී සේවයට වාර්තා කිරීම සහ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් විවිධ අවවාද කිරීම් වලට ලක්වී තිබුණි. මෙම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව 2010 වර්ෂයේදී හා 2012 සිට 2015 දක්වා වර්ෂයන්හි දින 168 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම වැටුප් රහිත නිවාඩු දින වෙනුවෙන් අයකර ගැනීම් සිදුකර නොතිබුණි.

(උ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 14 වගන්තියට අනුව ආයතන ශාඛාවේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධාරියෙකු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟත්වය සමඟ අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව යම් කාලසීමාවකට හෝ ස්ථිරව හෝ නිලධාරියෙකු ආයතනය වෙත පත්කරනු ලැබිය හැකි වුවද ද්විතීයන පදනම මත බඳවාගෙන තිබුණු නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු.47,135,565 ක වටිනාකමකට අයිතම 2,311 ක් මිලදීගැනීමට සැලසුම් කර තිබුණද එම ප්‍රමාණයෙන් භාණ්ඩ අයිතම 1,278 ක් එනම් මුළු ප්‍රමාණයෙන් සියයට 55 ක් රු.41,283,407 ක් වැයකර මිලදීගෙන තිබුණි.

(ආ) ආයතනය විසින් 2016 වර්ෂය සඳහා සකස්කරන ලද ප්‍රසම්පාදන සැලසුම ක්‍රියාත්මක කිරීමේදී සැලසුම් කළ අයිතම 753 ක් වෙනුවෙන් අයිතම 845 ක් මිලදීගෙන තිබුණි. එහිදී සැලසුම් කළ ප්‍රමාණයට වඩා භාණ්ඩ 136 ක් අඩුවෙන් ද භාණ්ඩ 228 ක් වැඩියෙන් ද මිලදීගෙන තිබුණු අතර ප්‍රසම්පාදන සැලසුම නිවැරදි කළමනාකරණ පාලන කාරක ලෙස භාවිතාකර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

2016 වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්තන  ආදායම් හා වියදම් තත්‍ය වටිනාකම් සමඟ සැසඳීමේදී සියයට 15 සිට සියයට 76 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2009 ජුනි 01 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ (I) හා (II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු. 1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු. 156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාට වරින්වර දැනුම්දෙන ලදී. පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත නොවීම.<br>(ii) ගැණුම් ඇණවුම් නිකුත් කරන අවස්ථාවේදීම භාණ්ඩ ලැබීම ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන තිබීම.<br>(iii) වත්කම් හා වගකීම් විෂයයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම.<br>(iv) ගෙවිය යුතු වියදම් සඳහා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | තාත්විකව ඇස්තමේන්තුවල පිළියෙල නොකිරීම සහ වියදම් දැරීම අයවැය පාලනයෙන් තොරව සිදුකිරීම. |
| (ඇ) | තොග පාලනය | යල් පැනගිය, අක්‍රීය, තොග සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හා පොත්පත් යාවත්කාලීන නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඉ) | වත්කම් කළමනාකරණය | ආයතනයට අයත් ඉඩම්, වාහන නිසි පරිදි පවරා නොගැනීම හා වත්කම් ඌන උපයෝජිතව පැවතීම සහ ඵලදායී ලෙස යොදා නොගැනීම. |
| (ඊ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම, දීර්ඝ කාලයක් තනතුරුවල වැඩ බැලීමට නිලධාරීන් පත්කිරීම සහ ද්විතීයන පදනම මත හා අනුයුක්ත පදනම මත තාවකාලික නිලධාරීන් පත්කිරීම. |
| (උ) | රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ඥානස අධ්‍යාපනික වැඩසටහන් සකස්කර විකාශන කටයුතු සිදුනොකිරීම. |
| (ඌ) | නේවාසිකාගාර පරිපාලනය | ඌන උපයෝජිත නේවාසිකගාර ඵලදායි ලෙස යොදා නොගැනීම, නිසි පරිදි නඩත්තු නොකිරීම හා නේවාසිකාගාර කමිටු රැස්වීම් නොපැවැත්වීම |